# කර්මාන්ත දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
## கைத்தொழில் திணைக்களம் (மேல் மாகாணம்)
## DEPARTMENT OF INDUSTRIES (WESTERN PROVINCE)

අංක:787/3, නව සිටි ගොඩනැගිල්ල,
කඩුවෙල පාර,
මාලඹේ

இல 787/3,நியு சிடி கட்டிடம்
கடுவெல வீதி,
மாலபே

No. 787/3, NawaCity Building,
Kaduwela Rd,
Malabe.


| මගේ අංකය<br>எனதுஇல<br>My No. | කදෙ/5/5හස්ත(ප්‍ර)5/2017 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.09.16 |
|---|---|---|---|---|---|

මහත්මයාණනි,මහත්මියනි/මෙනෙවියනි,

**ශිල්ප අභිමානි-2017**

**<u>බස්නාහිර පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය</u>**

**"ශිල්ප අභිමානි"** ජාතික හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව,බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව ජාතික ශිල්ප සභාව සමග ඒකාබද්ධව පවත්වනු ලබන පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය **2017 සැප්තැම්බර් මස22,23,24** යන දින වලදී **කොළඹ J.D.A පෙරේරා කලාගාරයේදී(දෘෂ්‍ය කලා පීඨය,සෞන්දර්ය විශ්ව විද්‍යාලය,අංක 46,හොර්ටන් පෙදෙස,කොළඹ 07)**පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

බස්නාහිර පළාත් කර්මාන්ත ශිල්පීන් වන ඔබට,ඔබගේ නිර්මාණ ජාතික ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කල හැකි එකම මාර්ගය මෙය වන බැවින් ඒ සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා කර ගන්නා මෙන් ගෞරවයෙන් ආරාධනා කරමි.ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවය **2017 සැප්තැම්බර් මස 22** වන දින පෙ:ව **10.30**ට යෙදී ඇත.

ඒ අනුව පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා නිර්මාණ භාර ගැනීම පහත සඳහන් ස්ථාන වලදී සිදු කිරීමට කටයුතු යොදා ඇත.

| දිස්ත්‍රික්කය | දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|---|
| කොළඹ | 2017.09.15 | පෙ:ව 9.00 - ප:ව 4.00 | බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>ප්‍රධාන කාර්යාලය(මාළඹේ) |
| ගම්පහ | 2017.09.15 | පෙ:ව 9.00 - ප:ව 4.00 | කාෆ්ට්ලංකා අලෙවිසැල,කච්චේරි සංකීර්ණය,ගම්පහ<br>දුර කථනඅංකය -033-3729760 |
| කළුතර | 2017.09.15 | පෙ:ව 9.00 - ප:ව 4.00 | විසිතුරු මැටි මැටි මධ්‍යස්ථානය,නාගස්හන්දිය ,දෙදියවල<br>දුරකථන අංකය-034-2238540 |


| | අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | සහ. අධ්‍යක්ෂ (පාලන)<br>உதவிப் பணிப்பாளர்(நிர்வாகம்)<br>Asst Director (Admin) | සහ. අධ්‍යක්ෂ සැලසුම්)<br>உதவிப் பணிப்பாளர்(திட்டமிடல்)<br>Asst Director (Planning) | ගණකාධිකාරී<br>கணக்காளர்<br>Accountant | පරිපාලන නිලධාරී<br>நிர்வாகஅலுவலர்<br>Admin. Officer | පොදු<br>பொது<br>General |
|---|---|---|---|---|---|---|
| දුරකථන/தொலைபேசி/Telephone | 4413184 | 2882322 | 4413187 | 4413186 | 4413189 | 4413188 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 4413185 | | | | | |

ඔබගේ පදිංචිය අනුව ඉහත ස්ථාන වලදී නිර්මාණ භාර දීම කලයුතු අතර,**<u>දිස්ත්‍රික්ක තුනෙහිම මිල අධික නිර්මාණ හා ප්‍රවාහනයට අපහසු නිර්මාණ පමණක් 2017.09.18 වන දින පෙ:ව 9.00 - ප:ව 3.00 අතර කොළඹ J.D.A පෙරේරා කලාගාරය</u>** වෙත ගෙනවිත් භාර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ප්‍රදර්ශනයට නිර්මාණ ඉදිරිපත් කිරීමේදි සෑම නිර්මාණයක් සඳහාම මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර පිටපත් දෙකකින් සම්පූර්ණ කර භාර දිය යුතුය. මේ සමග එවනු ලබන ආකෘති පත්‍ර ප්‍රමාණවත් නොවේ නම් ,අවශ්‍ය ප්‍රමාණයට නැතහොත් නිර්මාණ භාර දෙන ස්ථානයෙන් එදිනට ලබා ගත හැකිය.)

මෙම ප්‍රදර්ශනය සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සෑම නිර්මාණයක්ම  අලෙවි කිරීමට කැමැත්ත ප්‍රකාශ කල යුතු අතර මේ සඳහා මිලක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

ප්‍රදර්ශනය අවසානයේ එනම් 2017.09.25 වෙනි දින පෙ:ව 9.00 සිට  ප.ව 2.00 දක්වා ඔබගේ ප්‍රදර්ශන නිර්මාණ නැවත භාර ගත හැකි වන අතර,කොළඹ දිස්ත්‍රික්කයේ නිර්මාණ මෙදින ආපසු භාර ගැනීම අනිවාර්යය බව කාරුණිකව සලකන්න.

කළුතර හා ගම්පහ දිස්ත්‍රික් නිර්මාණ 2017.09.27 දින නිර්මාණ භාර දුන් දිස්ත්‍රික් මධ්‍යස්ථාන වලදීම නැවත භාර ගත යුතුය.එසේ භාර නොගන්නා නිර්මාණ සම්බන්ධව කර්මාන්ත දෙපාර්තමේන්තුව වගකීමට බැඳී නොසිටින බව වැඩි දුරටත් දන්වා සිටිමි. නිර්මාණ ලබා දීමේදි ඔබ වෙත ලබා දුන් පෝරමය නිර්මාණ භාර ගැනීමේදි ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

ජයග්‍රාහි නිර්මාණ ජාතික ප්‍රදර්ශනයට යොමු කරන බැවින්,එම නිර්මාණ ඔබ වෙත ලබා දෙනුයේ ජාතික ප්‍රදර්ශනයෙන් අනතුරුව වේ.

බස්නාහිර පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ඔබගේ  නව නිර්මාණ ඉදිරිපත් කර ජාතික ප්‍රදර්ශනයේ ජයග්‍රහකයන් වී ,අප පළාත් සභාවට කිර්තියක් අත්පත් කර දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

වැඩි දුර විමසීම

- සහකාර අධ්‍යක්ෂ ( පාලන) 011-2882322
- පුහුණු හා ප්‍රදර්ශන 011-3049208
- මානෙල් පද්මලතා මිය (කර්මාන්ත ප්‍රවර්ධන නිළධාරි) 071-2324442

ඩී. එම් .එන් චන්ද්‍රාදිත්‍ය

කර්මාන්ත අධ්‍යක්ෂ(බ ප)

පිටපත - 1.සභාපති, ජාතික ශිල්ප සභාව

2.සම්බන්ධීකරණ  නිළධාරි, ජාතික ශිල්ප සභාව කොළඹ/ගම්පහ/කළුතර | දැ ග.ස

3.ස්ථානභාර නිළධාරි,ගම්පහ අලෙවි සැල/දෙදියවල මැටි කර්මාන්ත මධ්‍යස්ථානය | අ.ක.ස

# <u>ශිල්ප අභිමානි - 2017</u>

## <u>බස්නාහිර පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය</u>

## <u>ප්‍රදර්ශන තේමාව- ඉතිහාසය හා අභිමානය</u>

### <u>නිර්මාණ භාර දීම</u>

1. නිර්මාණයේ අයිතිකරුගේ නම(සිංහලෙන්)..........................................................................................

.......................................................................................................................................................

නිර්මාණයේ අයිතිකරුගේ නම(ඉංග්‍රීසියෙන්)........................................................................................

.......................................................................................................................................................

(ඔබට ජයග්‍රහණය හිමි වුවහොත් චෙක්පත ලියනුයේ මේ නමින් වන බැවින් පැහැදිලිව හා නිවැරදිව මෙහි නම සඳහන් කරන්න)

2. නිර්මාණයේ අයිතිකරුගේ ලිපිනය ..........................................................................................

.......................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය ..........................................................................................

4. දුරකථන අංකය ..........................................................................................

5.තරග අංශ අතුරින් ඔබගේ නිර්මාණය අයත් වන තරග අංශය හා අංකය.....................................................

.......................................................................................................................................................

6.ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නිර්මාණ වල විස්තර-

| නිර්මාණයේ නම | යොදා ගත් අමු ද්‍රව්‍ය | සංකේත අංකය |
| --- | --- | --- |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

7.ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නිර්මාණයේ විකුණුම් වටිනාකම.......................................................................

8.නිර්මාණය විකිණීමට කැමති අකැමැති බව..........................................................................................

. 9. ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නිර්මාණය සඳහා ඇණවුමක් ලැබුණොත් ඒවා නිර්මාණය කර අලෙවිය සඳහා ලබා දීමට හැකියාව තිබේද යන්න - ඔව්/නැත

10.ප්‍රදර්ශනය සඳහා නිර්මාණය භාර දෙන අයගේ නම සහ ලිපිනය

.................................................................................................................................................................

.................................................................................................................................................................

මා විසින් 2017 බස්නාහිර පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන ලද සියලුම නිර්මාණ මගේ ස්වං නිර්මාණ බවත්,මෙම නිර්මාණ මීට පෙර වෙනත් කිසිදු ප්‍රදර්ශනයක් සඳහා ඉදිරිපත් කර නොමැති බවත් ,මා බස්නාහිර පළාතේ පදිංචි කරුවෙකු වන බවත් මෙයින් සහතික කරමි.එසේම විනිශ්ච මණ්ඩලයේ තීරණයට අනුව මා හට ජයග්‍රහණයක් ලැබුණොත්,ග්‍රාම නිළධාරි මහතාගේ පදිංචිය තහවුරු කරමින් ලිපියක් ලබා දීමට එකග වෙමි.

.................................................... ....................................................................

දිනය ශිල්පියාගේ අත්සන

<u>සහතික කිරීම</u>

ඉහත නිර්මාණ/නිර්මාණයන්....................................................................ශිල්පියා/ශිල්පිනිය විසින්

කරන ලද නිර්මාණයක් බවට සහතික කරමි.

.......................................................

ජාතික ශිල්ප සභාවේ

පළාත් සහකාර අධ්‍යක්ෂ/සංවර්ධන සහකාර

අත්සන හා නිළ මුද්‍රාව

.......................................................................................................................................................

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

| නිර්මාණයේ නම | සංකේත අංකය | අලෙවි වටිනාකම |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

ඉහත නිර්මාණය,2017 හස්ත කර්මාන්ත ප්‍රදර්ශයට අද දින භාර ගතිමි

නිර්මාණ භාර ගත් අයගේ අත්සන ........................................................................

නම...................................................... දිනය ...............................................................